(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක **20.**]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2022 මාර්තු 25 සිකුරාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **දිලුම් අමුණුගම මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජීවන් තොන්ඩමන් මහතා,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **මායාදුන්න චින්තක අමල් මහතා**

ගරු **තවරාජා කලෙයි අරසන් මහතා**

ගරු **ජේ. සී. අලවතුවල මහතා**

ගරු **තිසකුට්ටි ආරච්චි මහතා**

ගරු **යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා**

ගරු **සංජීව එදිරිමාන්න මහතා**

ගරු **අකිල එල්ලාවල මහතා**

ගරු **ලලිත් එල්ලාවල මහතා**

ගරු **සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ලලිත් වර්ණ කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු **බුද්ධික පතිරණ මහතා**

ගරු **අනුප පස්කුවල් මහතා**

ගරු **නිමල් පියතිස්ස මහතා**

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා**

ගරු **නිරෝෂන් පෙරේරා මහතා**

ගරු **කේ. සුජිත් සංජය පෙරේරා මහතා**

ගරු **නලින් ප්‍රනාන්දු මහතා**

ගරු **මුදිතා ප්‍රිශාන්ති මහත්මිය**

ගරු **(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **උද්දික ප්‍රේමරත්න මහතා**

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**

ගරු **(මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා**

ගරු **රෝහණ බංඩාර මහතා**

ගරු **ශාන්ත බණ්ඩාර මහතා**

ගරු **රිසාඩ් බදියුදීන් මහතා**

ගරු **සුදත් මංජුල මහතා**

ගරු **කේ. කාදර් මස්තාන් මහතා**

ගරු **ඉම්රාන් මහරූෆ් මහතා**

ගරු **එස්. එම්. එම්. මුෂාරෆ් මහතා**

ගරු **මොහමඩ් මුසම්මිල් මහතා**

ගරු **වසන්ත යාපාබණ්ඩාර මහතා**

ගරු **නිපුණ රණවක මහතා**

ගරු **බී. වයි. ජී. රත්නසේකර මහතා**

ගරු **කුමාරසිරි රත්නායක මහතා**

ගරු **අලි සබ්රි රහීම් මහතා**

ගරු **ඉෂාක් රහුමාන් මහතා**

ගරු **මුජිබුර් රහුමාන් මහතා**

ගරු **(ආචාර්ය) සුරේන් රාඝවන් මහතා**

ගරු **අජිත් රාජපක්ෂ මහතා**

ගරු **ගුණතිලක රාජපක්ෂ මහතා**

ගරු **(වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා**

ගරු **උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**

**ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා**

**ගරු එම්. රාමේෂ්වරන් මහතා**

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු ගාමිණී වලේබොඩ මහතා**

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**

**ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා**

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**

**ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ටිකිරි කේ.ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2020 වර්ෂය සඳහා ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, මුදල් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**2. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) බදුල්ල, කැප්පෙටිපොළ පාර, අංක 144/8 එල් දරන ස්ථානයෙහි පදිංචි පී. එස්. සී. පියසිංහ මහතාගෙන් ලැබුණු 2022.01.14 දිනැති පෙත්සම ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) බද්දේගම, හල්පාතොට, ෆෙඩ්රු වත්ත, අංක 102 සී දරන ස්ථානයෙහි පදිංචි කේ. පී. සිරිපාල මහතාගෙන් ලැබුණු 2022.01.11 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(3) නිට්ටඹුව, රන්පොකුණගම, අංක ඒ/ඒ/6/5 දරන ස්ථානයෙහි පදිංචි ටී. පී. විනෝද් රණසිංහ මහතාගෙන් ලැබුණු 2022.01.19 දිනැති පෙත්සම ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන):** අධිකරණ අමාත්‍යවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා පිළිගැන් වූ පනත් කෙටුම්පත,— (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත, 2022 අප්‍රේල් 05 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද අධිකරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 ජනවාරි 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.30 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 22හි සහ 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා**: පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් මහාමාර්ග අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2022 ජනවාරි 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2022 මාර්තු 24 දින තේරීම් කාරක සභාව විසින් තීරණය කළ පරිදි විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව "විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව" ලෙස නැවත නම් කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. අත්‍යාවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය:** අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2022 මාර්තු 21 දිනැති අංක 2272/09 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරනු ලැබ, 2022.03.24 දින ඉදිරිපත් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ශෝක ප්‍රකාශ යෝජනා:** අග්‍රාමාත්‍ය සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්, අභාවප්‍රාප්ත ගරු බැටී වීරකෝන් මහතා, ගරු කේ. තන්ගේෂ්වරී මෙනෙවිය, ගරු ජස්ටින් ගලප්පත්ති මහතා, ගරු එම්. එස්. සෙල්ලසාමි මහතා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

(පූ.භා. 10.31 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා, ගරු ගයන්ත කරුණාතිලක මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.12 ට ගරු අජිත් රාජපක්ෂ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි ගරු ජේ. සී. අලවතුවල මහතා, ගරු බුද්ධික පතිරණ මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(ප.භා. 1.30 ට ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය යුතු ය" යි බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(ප.භා. 2.35 ට ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා මූලාසනාරූඪ විය.)

අභාවප්‍රාප්ත ගරු බැටී වීරකෝන් මහතා, ගරු කේ. තන්ගේෂ්වරී මෙනෙවිය, ගරු ජස්ටින් ගලප්පත්ති මහතා, ගරු එම්. එස්. සෙල්ලසාමි මහතා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා අනුමත කරමින් කථානායකවරයා සමඟ ඊට එකතු වූ

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මෙම යෝජනා සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත් ශෝකයට පත් පවුලේ අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරන ලදී.

**9. කල් තැබීම:** මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය; අ.භා. 3.47 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2022 අප්‍රේල් 05 අඟහරුවාදා පූ.භා. 10.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.